# ගුත්තිල වෙණ නද

සිය පින් සිරින් සරු
දෙතිස් ලකුණෙන් විසිතුරු
කෙලෙසුන් කෙරෙන් දුරු
වදිම් මුනි උතුමන් තිලෝගුරු

යනුවෙන් ලඝු අකුරු දෙකක් හා ගුරු අකුරකින් යුතු 'වායු ගණයෙන්' කාව්‍යය ආරම්භ කළේ ද එහි අනිෂ්ට විපාක දූන දූන ම බව ජනප්‍රවාදයේ එයි.

1. ගුත්තිල ඇදුරු සඳ
විණා වයන ලෙස ඉඳ
පසෙක පනවන ලද
සුදුසු අස්නෙක ගොසින් උන් සඳ

අන්වය* : ගුත්තිල ඇදුරු සඳ ඉඳ විණා වයන ලෙස පසෙක පනවන ලද සුදුසු අස්නෙක ගොසින් උන් සඳ,

අර්ථය : ගුත්තිල ඇදුරුතුමා ඉඳ ගෙන විණා වයනු පිණිස පසෙක පනවන ලද සුදුසු අස්නෙක ගොසින් උන් කල්හි,

විස්තර (1) **පසෙක පනවන ලද** : පැනවීම නම් නියම කිරීමයි. කාටත් පොදුවේ නොව මේ අසවලාට ය, යන නියමය ඇති ව කෙනකුට සුදුසු පරිදි පිළියෙල කරන ලද අසුන පනවන ලද අසුන යි.

2. නො දූන ම තමා බල
සබයට අවුත් නො පැකිළ
වැඳ රද පද කමල
දෙසෙක මූසිලයා ද උන් කල

අන්වය : පහසු ය.

අර්ථය : තමාගේ බලය දන්නේ නැති ව මූසිල ද පැකිළීමක් නැති ව සභාවට අවුත් රජුගේ පා කමල වැඳ, පැත්තක උන් කල්හි,

විස්තර (1) මූසිල පැකළීමක් නැති ව සභාවට ආවේ තමාගේ බල නොදත් නිසා ය. තම බලයේ පමණ දන්නේ නම් වාදයෙන් තමාට ජය ගත නොහැකි බව වටහා ගනී. එසේ වූ කල සිතේ ධෛර්යයක් ඇති නොවන හෙයින් පැකිළීමක් ඇති වේ.

* අන්වය යනු අර්ථය ගැනීම සඳහා පද ගළපන පිළිවෙළයි.

විස්තර (2) : කමල යනු රතු නෙළුම් ය. රජුගේ පාද රත් පැහැ බව සැලකීමෙන් පද කමල යයි කීහ.

3. සිදු වේ මැ යි වෙසෙස
මහ බෝසතුන් අදහස
ඉන් සුර පුරෙන් බැස
අවුත් බෝසත්හු දිනවන ලෙස

අන්වය : වෙසෙස මහ බෝසතුන් අදහස සිදු වේ මැ යි. ඉන් සුරපුරෙන් බැස බෝසත්හු දිනවන ලෙස අවුත්,

අර්ථය : විශේෂයෙන් මහ බෝසතුන්ගේ අදහස සිද්ධ වන්නේ ම ය. එසේ හෙයින් දිව්‍ය ලෝකයෙන් බැස බෝධිසත්ත්වයන් දිනවන පරිද්දෙන් පැමිණ,

4. කැර මිණි බරණ රැස්
රසින් සුර සැවු සුවහස්
සුරන් සහ සහසැස්
නො කැර සිටියේ අහස් කුස හිස්

අන්වය : මිණි බරණ රැස් රසින් සුවහස් සුර සැවු කැර සුරන් සහ සහසැස් අහස් කුස හිස් නොකර සිටියේ.

අර්ථය : මාණික්‍යාභරණ රාශීන්ගේ රශ්මියෙන් බොහෝ දේදුනු ලක්ෂ ගණන් ඇති කොට ශක්‍ර තෙමේ දේව සේනාවන් හා අහස් කුස පුරවා සිටියේ ය.

විස්තර (1) ශක්‍රයාගේ හා සෙසු දෙවිවරුන්ගේ ආභරණවල මාණික්‍යයන්ගේ රශ්මිය අහසට නැගුණ විට දෙව්දුනු රාශියක් නැගුණා සේ ය.

(2) සහසැස් : සහස් ඇස් = සහසැස්. ශක්‍රයා ය.

5. දෙදෙන ම ඉඳ දෙ පිට
සව් සත සතන් තුටු කොට
සුර ගඳඹුන් ලෙසට
පටන් ගෙන වෙණ ගායනාවට

අන්වය : පහසු ය.

අර්ථය : ගුත්තිල මූසිල දෙදෙනා දෙපැත්තෙහි හිඳ ගෙන, සියලු සත්ත්වයන්ගේ සිත් සතුටු කරමින් දිව්‍ය ගාන්ධර්වයන් මෙන් වීණා ගායනාවට පටන් ගෙන,

ගුත්තිල වෙණ නද

1 ඉහත කවි පෙළ රචනා කරන ලද්දේ කවුරුන් විසින්ද?

2 මෙම කවි පන්තියට පාදකවූ ජාතක කතාව නම් කරන්න්

3 ඉහත කවි පන්තිය කුමන යුගයක රචනා කරන ලද්දේද?

4 එම යුගය කුමන රජ දවසක්ද?

5 එම යුගයේ බිහිවූ විදග්ද කවීහු දෙදෙනෙක් නම් කරන්න.

6 ඉහත කවි පන්තියේ තුන්වෙනි කවියේ සිදුවූ විශේෂත්වය කුමක්ද?

7 මෙම කවි පන්තියේ ඇති "රූපකයක්" දක්වන්න

8" සුර සැචි" යන්නේහි සරල අදහස ලියන්න

9 ශක්‍රයාගේ හා සෙසු දෙවිවරුන්ගේ අබරණ වල මැණික් රශ්මිය අහසට නැගුණු විට ඇති වුයේ කුමක්ද?

10 "සහසැස්" යනු කවුරුන්ද?